# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2205/19 - 2020 දෙසැම්බර් මස 13 වැනි ඉරිදා - 2020.12.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ගුවන් හමුදා පනත**

MOD/DEF/HRM/SLAF/REG/02.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වන ව්‍යවස්ථාව සමග කියවිය යුතු (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ 155 වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝගය.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති.

2020 ඔක්තෝබර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

නියෝගය

1978 පෙබරවාරි මස 10 වන දින අංක 304 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද 1978, ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුද නියෝගවල 19 වන නියෝගයට ඉක්බිතිව පහත සඳහන් නියෝගය එකතු කිරීමෙන්, එම නියෝග මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"19 (අ) සේවා හේතූන් මත එම මාරුවීම සඳහා සුදුසුකම ඇත්තා වූ ගුවන් භටයකු වයස අවුරුදු 55 එළඹුණ විට ගුවන් හමුදාධිපතිගේ අනුමැතිය ඇතිව ස්වේච්ඡා උපසේවය වෙත මාරු කළ හැකි ය:

එසේ වුව ද, මෙම නියෝගයේ ඉහත සඳහන් විධිවිධාන අනුව ස්වේච්ඡා උපසේවයට මාරු කළ යුතුවන ගුවන් භටයකුගේ සේවය ගුවන් හමුදවේ යහපත තකා දීර්ඝ කළ යුතු යැයි, ගුවන් හමුදාධිපති අදහස් කරන්නේ නම්, ස්වේච්ඡා ගුවන් භටයකුගේ සේවා කාලය කෝප්‍රල් සහ ඊට ඉහළ නිලයකට නියමිත වයස් සීමාව ඉක්මවා මුළු එකතුව අවුරුදු තුනකට නොවැඩි වන පරිදි, වරකට එක් අවුරුද්ද බැගින් ස්වේච්ඡා ගුවන් හමුදවේ අණදෙන නිලධාරීගේ නිර්දේශය මත සේවය දීර්ඝ කිරීම සඳහා ගුවන් හමුදාධිපතිට අනුමැතිය ලබා දීමට පුළුවන."

1A - G 33328 — 25 (2020/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.